# ඇතුළු පිටු


**1. ප්‍රාරම්භක වාක්‍යය ........ 03**

**2. උපලේඛන අංක 2 - පොදු විධිවිධාන හා වරප්‍රසාද**

2.1 පදිංචිය, චාරිකා හා රැකියාව ........ 04
2.2 වයස සනාථ කිරීම ........ 04
2.3 නීතිය හා අර්ථ දැක්වීම ........ 04
2.4 වාරික ගෙවීම/අනුග්‍රහ කාලසීමාව ........ 04
2.5 වාරික නොගෙවීම ........ 05
2.6 අප්‍රාණික ඔප්පු ප්‍රාණවත් කිරීම/ප්‍රතිෂ්ඨාපනය කිරීම ........ 05
2.7 රක්ෂණ ඔප්පුවේ වෙනස්කිරීම් ........ 05
2.8 පවාරණ අගය ........ 05
2.9 ගෙවා නිමි ඔප්පු/ පරිණත අගය ........ 05
2.10 ප්‍රසාද දීමනා ........ 05
2.11 පැවරීම ........ 05
2.12 නම්කිරීම ........ 05
2.13 හිමිකම් ඉල්ලා සිටීමේ ක්‍රියාපටිපාටිය ........ 06
2.14 ආවරණ හිමි නොවන කාලය ........ 06
2.15 සියදිවි නසා ගැනීම ........ 06
2.16 සම්පූර්ණයෙන්ම වගකීම් බැහැර කිරීම ........ 07
2.17 වාරිකයන් අහිමිවීම ........ 07
2.18 අතුරුදහන් වූ පුද්ගලයන් ........ 07
2.19 අවලංගු කිරීමේ අයිතිය ........ 07
2.20 විවාද රහිත බව ........ 08
2.21 බදුකරණය ........ 08
2.22 පැමිණිලි සහ අභියාචනා කළමණාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය ........ 08-09
2.23 ප්‍රාථමික ප්‍රතිලාභය සඳහා වූ සීමාවන් ........ 09

**3. උපලේඛන අංක 3 - ජීවිත රක්ෂණ අතිරේක ප්‍රතිලාභ**

3.1 හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය (ADB) ........ 10-11
3.2 පිළිකා රැකවරණ ආවරණය (CCC) ........ 12-16

**4. උපලේඛන අංක 4 - මෙම රක්ෂණ ඔප්පුව සඳහා අදාල වන නිර්වචන ........ 17-21**

4.1 මූලික නිර්වචන ........ 17-19
4.2 අතිරේක ප්‍රතිලාභ සඳහා අදාල වන මූලික නිර්වචන ........ 19-21


Specimen

Specimen

යූනියන් ඇෂුවරන්ස්
ජෝන් කීල්ස් සමාගමකි

මෙහි පළමු උපලේඛණයේ නම් කර ඇති රක්ෂිතයා/යන්, 1982 අංක 17 දරණ සමාගම් පණත යටතේ සංස්ථාපිත කොට එන් (පී බී එස්) 137 අංකය යටතේ ලියාපදිංචි කොට හා 2007 අංක 7 දරණ සමාගම් පණත යටතේ නැවත සංස්ථාපිත කොට පී ක්‍යු 12 අංකය යටතේ ලියාපදිංචි කොට අංක 20, ශාන්ත මයිකල් පාර, කොළඹ 03 යන ලිපිනයේ ලියාපදිංචි ව්‍යාපාර ආයතනය පවත්වාගෙන යන යූනියන් ඇෂුවරන්ස් පී එල් සී (මින් මතු “සමාගම” යනුවෙන් හැඳින්වෙන) සමඟ මෙම ඔප්පුවේ අඩංගු නියමයන් මත හා රක්ෂිතයා/යන් විසින් රක්‍ෂණය සඳහා කර ඇති යෝජනාවක (සහ කිසියම් ඇතිරේක යෝජනාවක හෝ මැමයක) පදනම මත රක්‍ෂණයක් සඳහා ගිවිසගෙන ඇත.

ඔප්පුවේ පළමු උපලේඛණයට අනුකූලව වාරිකයන් සමාගම වෙත ගෙවනු ලැබුවහොත්, එවිට එකී උපලේඛණයේ සඳහන් ප්‍රතිලාභ ගෙවිය යුතු වන සිද්ධියක් සිදුවූ විට, එවැනි ප්‍රතිලාභ සමාගම විසින් ගෙවනු ඇත.

මෙය අදාල පාර්ශව විසින් උපරිම සද්භාවයෙන් ඇති කරගන්නා ලද ගිවිසුමකි. ඒ අනුව හෝ කරුණු සදොස් ලෙස හුවා දැක්වීමක දී සමාගම මෙම ඔප්පුව ශූන්‍ය බවට ප්‍රකාශ කරනු ඇත.

මෙම ඔප්පුව සම්බන්ධයෙන් වන පැවරුමක් හෝ නාමිකයෙකු පිළිබඳ දැන්වීම් කිසිවක් වෙතොත්, එකී දැන්වීම සාමාන්‍යාධිකාරී ජීවිත මෙහෙයුම්, යූනියන් ඇෂුවරන්ස් සෙන්ටර්, නො.20, ශාන්ත මයිකල් පාර, කොළඹ 03 ලිපිනයට එවිය යුතුය.

මින්මතු දැක්වෙන උපලේඛණ පොදු ඔප්පු කොන්දේසි හා වරප්‍රසාද, කොන්දේසී වගන්ති තහවුරු ප්‍රකාශ ආදියද මෙහිලා ගිවිසුමේ පදනමට අඩංගු බව සලකනු ලැබේ.

ප්‍රධාන මෙහෙයුම් නිලධාරී

ප්‍රධාන විධායක නිලධාරී / ප්‍රධාන නිලධාරී

වැදගත්

මෙය නීත්‍යානුකූලව බැඳී ඇති ලේඛනයකි. කරුණාකර මෙය සුරක්ෂිත ස්ථානයක තබන්න. තවද, නියමිත පරිදි වාරික ගෙවා ඔප්පුවේ උපරිම ප්‍රතිලාභ ලබාගන්න.

යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී සමාගම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (IRCSL) බලපත්‍රලාභී රක්ෂණ ආයතනයකි.

Specimen

**උපලේඛන අංක 2**

## 2. පොදු විධිවිධාන හා වරප්‍රසාද

### 2.1 පදිංචිය, චාරිකා හා රැකියාව

මෙහි වෙනත් සඳහනක් තිබේ නම් මිස, මෙම ඔප්පුව පදිංචිය, චාරිකා හා රැකියාවට අදාල සෑම සීමාවකින්ම නිදහස්ය.

### 2.2 වයස සනාථ කිරීම

ඔප්පුව යටතේ යම් ගෙවීමක් කිරීමට පෙර, ජීවිත රක්ෂිතයාගේ (කලත්‍රයා, දරුවන්, දෙමව්පියන්) උපන්දිනය පිළිබඳව පිළිගත හැකි සහතිකයක් ඉල්ලා සිටීමේ අයිතිය සමාගම සතුවේ. ඔප්පුවේ සඳහන් කරන ලද වයස සාවද්‍ය වීම හේතුවෙන්ම ඔප්පුව අවලංගු නොවන නමුත් එයට අදාලව යම් සාධාරණ ගැලපීමක්, අදාල වාරිකය හෝ/සහ ප්‍රතිලාභ සම්බන්ධයෙන් සමාගම විසින් කරනු ඇත.

### 2.3 නීතිය හා අර්ථ දැක්වීම

(i) මෙම ඔප්පුවට අදාල වනුයේ ශ්‍රී ලංකාවේ වලංගු නීතියයි.

(ii) පද සම්බන්ධයෙන් අනුකූල වන අවස්ථා වලදී රක්ෂිතයා යන යෙදුමට ඔහුගේ හෝ ඇයගේ බූදල් භාරකාරයාද ඇතුලත් වන අතර ඒක වචන වලට බහු වචන පදද, බහු වචන පද වලට ඒක වචන පදද ඇතුලත් වේ.

(iii) එලෙසම මෙහිලා පද සම්බන්ධයෙන් අනුකූල වන අවස්ථා වලදී පුරුෂ ලිංග පද ස්ත්‍රී ලිංග පද වෙනුවෙන් ද ස්ත්‍රී ලිංග පද පුරුෂ ලිංග පද වෙනුවෙන් ද අදාල වේ.

(iv) ඔප්පුවෙහි පළමු උපලේඛනයේ දක්වා ඇති "අතිරේක ප්‍රතිලාභ" ප්‍රදානය කිරීම, අදාල අතිරේක ප්‍රතිලාභ උපලේඛනයෙහි සඳහන් කොන්දේසිවලට යටත් වනු ඇත.

(v) මෙම ඔප්පුවට අදාල ව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර නොගැලපීමක් ඇති වුවහොත් හෝ වෙනත් ඕනෑම අර්ථ නිරූපණයක් අවශ්‍ය වුවහොත් එය සිංහල පිටපතට අනුකූලව බලපැවැත්වෙනු ඇත.

(vi) මෙම රක්ෂණය යටතේ සියළුම වාරික හා ප්‍රතිලාභ ගෙවනු ලබන්නේ ශ්‍රී ලංකාවේ වලංගු මුදලිනි.

(vii) ඔබගේ පෞද්ගලික දත්ත පිළිබඳව සමාගම විසින් පිළිපදින ප්‍රතිපත්ති සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට සමාගමේ නිළ වෙබ් අඩවියේ ඇති (www.unionassurance.com/privacy-policy) පෞද්ගලිකත්ව ප්‍රතිපත්ති ප්‍රකාශනය වෙත පිවිසෙන්න

### 2.4 වාරික ගෙවීම/අනුග්‍රහ කාලසීමාව

මෙම ඔප්පුව යටතේ සලසා ඇති ප්‍රතිලාභ වෙනුවෙන් ගෙවනු ලබන සියලුම වාරික සඳහා පහත සඳහන් කොන්දේසි අදාල වනු ඇත.

(i) සෑම වාර මුදල් ගෙවීමක්ම නියමිත දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු අතර එම වාර මුදල් ගෙවූ බව පිළිග නුයේ සමාගමේ ප්‍රධාන කාර්යාලයට, ඕනෑම ශාඛා කාර්යාලයකට හෝ වාර මුදල් ලබාගැනීමට සමාගම විසින් බලය ලබා දී ඇති ආයතනයකට හෝ එහි ශාඛාවකට වාර මුදල් ලැබුණු විටදී පමණි.

(ii) අදාල වාරිකය ගෙවූ බවට වලංගු සාධකය ලෙස පිළිගැනෙනුයේ, සමාගම විසින් හෝ සමාගම විසින් වාරික ලබා ගැනීම සඳහා නිසි පරිදි බලය ලබාදී ඇති අනෙකුත් ආයතන විසින් මුදල් ලබා දුන් බවට ලබා දෙන සහතිකය වේ.

(iii) වාර මුදල් ගෙවීමට නියමිත දින සිට දින තිහක (30) අනුග්‍රහ කාලසීමාවක් වාරික ගෙවීම සඳහා ලබාදෙනු ලැබේ. මෙම අනුග්‍රහ කාල සීමාව අවසන් වූ පසුව ද අදාල වාරිකය නොගෙවා ඇත්නම්, පූර්ව දැනුම් දීමකින් තොරව රක්ෂණ ඔප්පුව හා එහි අඩංගු සියලුම ප්‍රතිලාභ සඳහා වන ආවරණ අහෝසි වනු ඇත. මෙම අනුග්‍රහ කාලසීමාව තුලදී ඔප්පුවට අදාල සෑම ප්‍රතිලාභයක්ම අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

Specimen

**2.5 වාරික නොගෙවීම**

අනුග්‍රාහක කාලසීමාවෙන් පසුවද වාරිකයන් හිඟව තිබේ නම් ඔප්පුව අප්‍රාණික වන අතර එදිනෙන් පසු පැනනගින එබඳු හිමිකම් සඳහා ප්‍රතිලාභ ගෙවීමක් සිදුනොවේ.

**2.6 අප්‍රාණික ඔප්පු ප්‍රාණවත් කිරීම/ප්‍රතිෂ්ඨාපනය කිරීම**

නියමිත වාරික නොගෙවීම හේතුවෙන් අප්‍රාණික වූ හෝ ස්වයංක්‍රීයව ගෙවානිමි බවට පත්වූ ඔප්පු නැවත ප්‍රාණවත් කිරීම හෝ ප්‍රතිෂ්ඨාපනය කිරීම පරිණත දිනයට පෙරාතුව ජීවිත රක්ෂිතයාගේ ජීවිත කාලය තුල එහෙත් අප්‍රාණික වූ දින සිට වසර පහක් (05) ඇතුලත සමාගමේ අභිමතය පරිදි අදාල වරප්‍රසාදයන්ට හා කොන්දේසි වලට යටත්ව සිදුකල හැකිය. ජීවිත රක්ෂිතයා රක්ෂණයට නුසුදුසු බව හෙලිවුවහොත් ප්‍රාණවත්/ප්‍රතිෂ්ඨාපනය කිරීම ප්‍රතික්ෂේප විය හැකිය.

**2.7 රක්ෂණ ඔප්පුවේ වෙනස්කිරීම්**

රක්ෂණ ඔප්පුවේ වෙනස්කිරීම් සඳහා රක්ෂණ ඔප්පුහිමියාගෙන් ලැබෙන ඉල්ලීම්, සමාගම විසින් සිය අභිමතය පරිදි, අවශ්‍ය යැයි සලකන නියමයන් සහ කොන්දේසි මත සලකා බැලිය හැකිය.

රක්ෂණ ඔප්පුවේ වරප්‍රසාද සහ කොන්දේසි, සමාගමේ බලයලත් නිලධාරියෙකු විසින් නිසි ලෙස අනුමත කර අත්සන් කරන ලද රක්ෂණ ඔප්පු පිටසනක් සහිතව මිස, අත්හැරීම හෝ වෙනස් කිරීම සිදුකල නොහැකිය.

**2.8 පවාරණ අගය**

මෙම ඔප්පුව පවාරණ අගයක් ලබා නොගනී.

**2.9 ගෙවා නිමි ඔප්පු/ පරිණත අගය**

කල්ඉකුත් වීමේ දිනයේදී මෙම ඔප්පුව යටතේ ගෙවා නිමි අගයක් හෝ කල්පිරීමේ වටිනාකමක් නොමැත.

**2.10 ප්‍රසාද දීමනා**

මෙම ඔප්පුව යටතේ ඔප්පු හිමියන් හට ප්‍රසාද දීමනා ලබා නොදෙන අතර මෙය ලාභ සඳහා දායක නොවේ.

**2.11 පැවරීම**

මෙම ඔප්පුව පිළිබඳව යම්කිසි පැවරීමක් වේ නම් එකී පැවරුම පිළිබඳ ලිඛිත දැන්වීමක් සමාගමට ලැබී, එය සමාගම විසින් පිළිගෙන වාර්ථාගත කොට තහවුරු කරන තෙක් එම පැවරීම සම්බන්ධයෙන් කිසිඳු බැඳීමක් සමාගම සතු නොවේ. තවද පැවරීමක් ලැබී එය ලේඛණගත කිරීමට පෙර සමාගම සෑහීමකට පත් වන පරිදි පරීක්ෂා කිරීම සඳහා මුල් පිටපත් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමේ අයිතිය සමාගම සතුවේ. පැවරීම ලේඛණගත කිරීමේදී, පැවරුමෙහි අඩංගු කරුණු පිළිබඳව හෝ එහි වලංගුභාවය හෝ නීතිමය බලපෑම පිළිබඳව වගකීමට හෝ ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට හෝ සමාගම බැඳී නොමැත.

**2.12 නම්කිරීම**

(i) ඔප්පු කාලසීමාව අතරතුර සමාගම වෙත ඉදිරිපත් කරන ලිඛිත දැන්වීමක් මගින් මෙම ඔප්පුව යටතේ නාමිකයෙකු/නාමිකයන් පත්කිරීමට හෝ එසේ නම් කරන ලද්දෙකු වෙනස් කිරීමට රක්ෂිතයාට හැකියාව ඇත.

(ii) අදාල නීති වලට යටත්ව නාමිකයන් වෙනස් කිරීමක් වලංගු වනුයේ එම වෙනස්කිරීම පිළිබඳව රක්ෂිතයා විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීම සමාගම විසින් පිළිගෙන වාර්ථාගත කොට තහවුරු කරන ලද්දේ නම් පමණි.

(iii) නාමිකයා/නාමිකයන් එසේ වෙනස් කරනු ලැබූ විට එම වෙනස් වීම් වලංගු ලෙස සලකනුයේ ලිඛිත දැන්වීම ලැබුනු දිනයේ සිටය. මෙම ඔප්පුව යටතේ සමාගම විසින් ගෙවිය යුතු මුදල් නාමිකයාට ලැබීම හා එම මුදල් ලැබුණු බව පිළිගැනීම මෙම ඔප්පුවට අනුව සමාගම මත පැවරෙන වගකීමෙන් නිදහස් කිරීමේ හා එකී මුදල් ගෙවීම පිළිබඳ තීරණාත්මක සාක්ෂියද වේ.

Specimen

(iv) ජීවිත රක්ෂිතයා මරණයට පත්වන විට නාමිකයා ජීවත්ව නොසිටී නම්, ගෙවිය යුතු මුදල රක්ෂිතයාගේ උරුමකරුවන්ට ගෙවනු ඇත.

(v) මෙම ඔප්පුව පිලිබඳව පැවරීමක් කල විට, දැනට පවතින නම්කිරීම්/නාමිකයා අවලංගු වේ. ඔප්පුව ප්‍රති පැවරුමක් කලවිට, ඔප්පුහිමියා විසින් පෙර පැවති නම්කිරීම්/නාමිකයා නැවත පත් කිරීම හෝ නව නාමිකයෙක්/නාමිකයින් ඇතුළත් කිරීම සඳහා සමාගම වෙත ලිඛිතව දැනුම් දීමක් සිදු කල යුතු වේ.

(vi) නම් කිරීමකට අදාල නාමිකයෙකුගේ අයිතිය ක්‍රියාත්මක වන්නේ ජීවිත රක්ෂිතයාගේ අභාවය හේතුවෙන් පැන නගින ප්‍රතිලාභ ගෙවීම් වලට පමණි.

### 2.13 හිමිකම් ඉල්ලා සිටීම් ක්‍රියාපටිපාටිය

ඔබගේ හිමිකම් ඉල්ලා සිටීම සම්බන්ධයෙන් කඩිනම් සහාය ලබාගැනීම සහ විමසීම් සඳහා කරුණාකර පහත දැක්වෙන ක්‍රම ඔස්සේ අප හා සම්බන්ධ වන්න.

- ඇමතුම් මධ්‍යස්ථාන පොදු දුරකථන අංකය: 0112990 990
- ක්ෂණික ඇමතුම්: 1330 (ක්‍රියාත්මක කාලය: පැය 24x7)
- ආයතනික විද්‍යුත් තැපෑල: info@unionassurance.com

හිමිකම් සැකසීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස, ඔබේ හිමිකම් ඉල්ලා සිටීම තක්සේරු කිරීම සඳහා කරුණාකර පහත සඳහන් සම්මත ලේඛන ඉදිරිපත් කරන්න. හිමිකම් වර්ගය මත පදනම්ව අවශ්‍ය වන සම්මත ලේඛන සඳහන් කර ඇත.

සෑම හිමිකම් ඉල්ලා සිටීමක්ම තක්සේරුකරණයකට යටත් වන අතර, ලැබී ඇති ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව අවශ්‍ය වුවහොත්, හිමිකම් ඉල්ලා සිටීමක් හා සම්බන්ධ වැඩිදුර හෝ අමතර ලේඛන සමාගමේ හිමිකම් අංශය විසින් හිමිකම් ඉල්ලා සිටින අයගෙන් ඉල්ලා සිටිනු ඇති බව කරුණාවෙන් සලකන්න. එසේම, ඉල්ලා ඇති පරිදි සියලුම අදාළ ලේඛන නිසි කලට ඉදිරිපත් කිරීම හිමිකම් තක්සේරුකරණ ක්‍රියාවලියට අත්‍යවශ්‍ය බව කරුණාවෙන් සලකන්න.

- මරණ හිමිකම්
  - හිමිකම් පෝරමය
  - මරණ සහතිකය
  - ජීවිත රක්ෂණ ඔප්පුවෙහි මුල් පිටපත / රක්ෂණ ඔප්පු සහතිකය
  - නාමිකයාගේ/ නාමිකයන්ගේ ජාතික හැඳුනුම්පත හෝ උප්පැන්න සහතිකය
  - නාමිකයා සහකරු හෝ සහකාරිය වන්නේ නම් විවාහ සහතිකය
  - මරණ පරීක්ෂණ වාර්තාව හා පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව (පවත්වා ඇත්නම්)

රක්ෂණ ඔප්පු කොන්දේසි සහ විධිවිධාන සඳහා කරුණාකර රක්ෂණ ඔප්පුවේ අදාළ කොන්දේසි පරීක්ෂා කර බලන්න.

හිමිකම් ප්‍රමාණය ස්ථාපිත කිරීම, මුදාහැරීමේ ලේඛන ලැබීම, සහ හිමිකම් ඉල්ලා සිටින අයගේ අනන්‍යතාව තහවුරු කිරීම ඇතුළු සියලු ලේඛන කටයුතු සපුරා ඇති විට, දින 14ක් ඇතුළත හිමිකම් පියවීම සිදුකෙරෙනු ඇත.

### 2.14 ආවරණ හිමි නොවන කාලය

මෙම ඔප්පුව යටතේ හදිසි අනතුරකින් සිදු නොවුන මරණයක් සඳහා ආරම්භක දිනයේ සිට දින තිහක (30) ආවරණ හිමි නොවන කාලසීමාවක් බලපැවැත්වේ.

### 2.15 සියදිවි නසාගැනීම

ඔප්පුව ආරම්භක දිනය හෝ ඔප්පුවේ දිනය හෝ ඔප්පුව ප්‍රාණවත්/ප්‍රතිෂ්ඨාපනය කල දිනය යන සිදුවීම් වලින් අවසන් සිදුවීමෙන් දින සිට ලිත් මාස දොළහ (12) ක් ඇතුලත ජීවිත රක්ෂිතයා ප්‍රකෘති සිහිය ඇතිව හෝ නැතිව සියදිවි නසාගත හොත් වටිනා ප්‍රතිෂ්ඨාවක් සඳහා සද්භාවයෙන් තුන්වන පාර්ශවයක් විසින් අත්කර ගන්නා ලද පැවරීමක් පිළිබඳ දැන්වීමක් මරණය වූ දිනට පෙරාතුව සමාගම වෙත ලිඛිතව ලැබී එය පිළිගෙන ඇත්නම් ඒ ප්‍රමාණය දක්වා හැර, මෙම ඔප්පුව ශූන්‍ය ඔප්පුවක් වනු ඇත.

Specimen

**2.16 සම්පූර්ණයෙන්ම වගකීම් බැහැර කිරීම**

පහත සඳහන් අවස්ථා වලදී මෙම ඔප්පුව යටතේ කිසියම් ගෙවීමක් කිරීමට සමාගම බැඳී නැත.

(i) පැමිණිලි කරන ලද මරණයට හෝ හදිසි අනතුරට හේතු වී ඇත්තේ හෝ සිද්ධි වී ඇත්තේ ජීවිත රක්ෂිතයා කිසියම් යුද්ධයකට හෝ යුධ තත්වයකට සමාන සිද්ධීන් වලට හෝ ත්‍රස්තවාදී ක්‍රියාවකට හෝ ආක්‍රමණයකට හෝ විදේශීය සතුරු ක්‍රියාවකට හෝ එදිරිවාදිකම් හෝ යුද්ධයකට සමාන සිද්ධීන් වලට (යුධ තත්වයක් ප්‍රකාශයට පත්කර හෝ නොකර ඇති විට) හෝ සිවිල් යුද්ධකයකට හෝ කැරලි කෝලාහලයකට, හමුදාවට විරුද්ධව කැරලි ගැසීමකට, විප්ලවයකට, රාජ සන්තක කිරීමකට සහ/හෝ රාජ්‍ය හෝ පළාත් පාලන අධිකාරියක නියෝගයක් මත කරන ලද ජන සතු කිරීමකට හෝ ඍජුව හෝ වක්‍රව සහභාගී හෝ සම්බන්ධවීමකදී හෝ තත්වාකාරයෙන් හෝ නීත්‍යානුකූලව පිහිටුවන ලද ආණ්ඩුවක් සාහසිකව පෙරලා දැමීමකට ඉලක්ක වන යම් ක්‍රියාකාරකමක් සිදුකරන සංවිධානයක් නමින් සහ/හෝ ඊට සම්බන්ධව යම් පුද්ගලයෙකු විසින් කරන ක්‍රියාවන් සඳහා සහභාගීවීමෙන් නම්; සහ/හෝ

(ii) පැමිණිලි කරන ලද මරණය හෝ හදිසි අනතුර සිදුවී ඇත්තේ එවැනි යුද්ධයක්, කැරැල්ලක්, ජන කැලඹීමක්, හමුදා කැරැල්ලක් හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක් මැඩ පැවැත්වීමට තැත් කිරීමේදී සන්නද්ධ හෝ පොලිස්, හමුදා වල කිසියම් සාමාජිකයෙකු විසින් ගත් කිසියම් ක්‍රියාමාර්ගයක ප්‍රතිඵලය හේතුවෙන් හෝ එවැනි යුද්ධයක්, කැරැල්ලක් හෝ ජන කැලඹීමක්, හමුදා කැරැල්ලක් හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක් සම්බන්ධයෙන් ඍජුව හෝ වක්‍රව සහභාගී වීමෙන් හෝ සම්බන්ධවීමක් සම්බන්ධයෙන් ජීවිත රක්ෂිතයා අත්අඩංගුවට ගැනීමට හෝ අල්ලා ගැනීමට තැත්කිරීමකදී; සහ/හෝ

(iii) මෙම රක්ෂණ ඔප්පුවට අදාල යෝජනාවේ, හෝ ප්‍රකාශනයේ සහ/හෝ එයට සම්බන්ධ සහ/හෝ මෙමරක්ෂණ ඔප්පුව යටතේ නියම කරන ලද වෙනත් ඕනෑම ලියවිල්ලක් සම්බන්ධව සියළු කරුණු අවංකව රක්ෂිතයා විසින් හෙලිදරව් කිරීමට අපොහොසත් වුවහොත් සහ/හෝ නොසලකා හැරියහොත්; සහ/හෝ

(iv) වංචා සහගතව හෝ සාවද්‍ය ලෙස තොරතුරු ඉදිරිපත් කිරීමෙන් වන හිමිකමකදී; සහ/හෝ

(v) ජීවිත රක්ෂිතයා විසින් කරන ලද නීතිවිරෝධී ක්‍රියාවක් හේතුවෙන්; සහ/හෝ

(vi) ජීවිත රක්ෂිතයා විසින් කුපිත කිරීමෙන් වූ පහර දීමකින් හෝ සාපරාධී ක්‍රියාවක් කිරීමේදී හෝ එසේ කරන්නට තැත් කිරීමේදී හෝ අත් අඩංගුවකට ගැනීමකට ප්‍රතිරෝධය දැක්වීමේදී හටගත් තුවාල,

මෙම වගන්ති යටතේ සමාගම එහි වගකීම බැහැර කල කවර අවස්ථාවක වුවද පැමිණිලි කර ඇති මරණය හෝ හදිසි අනතුරු සිදුවූයේ ඉහත සඳහන් ක්‍රියාවන් හෝ සිදුවීම් කිසිවක් හේතුවෙන් නොවන බව ඔප්පු කිරීමේ භාරය මෙම ඔප්පුව යටතේ කිසියම් ප්‍රතිලාභයකට හිමිකම්පානු ලබන අයෙකු වෙත පැවරේ.

**2.17 වාරිකයන් අහිමිවීම**

මෙම ඔප්පුවට අදාල යෝජනාවේ සහ ප්‍රකාශනයෙහි හෝ ගිවිසුම යටතේ වූ වෙනත් ලියකියවිලි වල අසත්‍ය හෝ වැරදි සහගත ප්‍රකාශ අඩංගු වේ නම්, මෙම ඔප්පුව බල රහිත වන අතර දැනටමත් ගෙවා ඇති වාරිකයන්ද අහිමි වනු ඇත.

**2.18 අතුරුදහන් වූ පුද්ගලයන්**

ජීවිත රක්ෂිතයා ජීවත්ව සිටියේ නම්, ඔහු ගැන තොරතුරු ස්වාභාවයෙන් දැනගත යුතුව තිබුණු තැනැත්තන් විසින් එක් වර්ෂයක් ඔහු ගැන කිසිම තොරතුරක් දැන නොගන්නා විටකදී ජනිත වන පූර්ව නිගමනයක් පදනම් කරගෙන ජීවිත රක්ෂිතයාගේ මරණය ඔප්පුකිරීමට උත්සුක වන අවස්ථාවකදී ජීවිත රක්ෂිතයා පිළිබඳව අසන්නට නොලැබුණු දින සිට වසර හත (07) ක කාලයක් ගෙවීයන තෙක් මෙම රක්ෂණ ඔප්පුව යටතේ කිසිදු හිමිකමක් ගෙවිය යුතු නොවේ.

**2.19 අවලංගු කිරීමේ අයිතිය**

රක්ෂිතයාට හෝ ජීවිත රක්ෂිතයාට ඔප්පුව ලැබී දින 21 ක් ඇතුලත (Cooling-off period/free-look period) ජීවිත රක්ෂණ ඔප්පුව සමාගමට ආපසු බාර දීමෙන් එම ඔප්පුව අවලංගු කරනු ලැබිය හැකිය. එවිට, වෛද්‍ය පරීක්ෂණ වාර්ථා හා රසායනාර පරීක්ෂණ සම්බන්ධ ගාස්තු අයකර ගැනීමෙන් පසුව, ගෙවන ලද ඉතිරි සියළුම වාරික මුදල් සමාගම විසින් ආපසු ගෙවනු ලැබේ. කෙසේ වුවද ඔප්පුව අවලංගු කරනුයේ, රක්ෂණ ඔප්පුව ලැබී දින විසි එකක්

Specimen

(21) ගතවීමෙන් පසුව නම්, එකී ඔප්පුව යටතේ පවාරණ අගයක් ලබා ඇත්නම් හැරෙන්නට, කිසිඳු මුදලක් නොගෙවනු ඇත.

### 2.20 විවාද රහිත බව

ඔප්පුව නිකුත් කල දින, ප්‍රාණවත් හෝ ප්‍රතිෂ්ඨාපනය කල දින අතුරෙන් අවසානයට යෙදෙන දින සිට අවුරුදු දෙකක (02) කාල සීමාවක් ඔප්පුව බලාත්මකව පැවතීමෙන් පසු, සමාගම ජීවිත රක්ෂිතයා හෝ රක්ෂිතයා සමග මෙම ඔප්පුව යටතේ ගිවිසුමකට ඇතුලත් කරවා ගැනීමට පෙළඹවීම සඳහා වැදගත් කරුණු පිළිබඳව අසත්‍ය, සාවද්‍ය හෝ වංචනික ප්‍රකාශ කර ඇති බවට පෙනී යන විටකදී හැරෙන්නට, මෙම ඔප්පුවේ වලංගුභාවය සම්බන්ධයෙන් විවාදයක් ඇති නොවන්නේය.

### 2.21 බදුකරණය

සමාගම, ඔප්පු හිමියා, නාමිකයා හෝ හිමිකම්පාන්නා විෂයෙහි යම් නීතියක්, නියමයක් මගින් හෝ අන්‍යාකාරයකින් පනවනු ලැබිය හැකි යම් බද්දක් හෝ වෙනත් ගෙවීමක් වෙනුවෙන් ආයෝජන ගිණුමෙන් සහ රක්ෂණය යටතේ ලැබීමට ඇති ප්‍රතිලාභ කිසිවකින් අඩු කිරීම අවශ්‍ය යයි හා උචිත යයි සමාගමේ මතය වන යම් අඩු කිරීම් කිරීමට සමාගමට හැකියාව ඇත.

### 2.22 පැමිණිලි සහ අභියාචනා කළමණාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය

පැමිණිලි සහ අභියාචනා කළමණාකරණය කිරීමේ ක්‍රියාවලියට අනුව සමාගම විසින් පිරිනමනු ලබන සේවාවන් හෝ සැලසුම් හා සම්බන්ධ පැමිණිලි හා අභියාචනා සඳහා වන ක්‍රියාපටිපාටිය පහත විදහා දැක්වෙයි. මෙම ක්‍රියාපටිපාටිය මඟින් කඩිනමින් සහ කාර්යක්ෂමව පැමිණිලි නිරාකරණය කිරීම සඳහා සැකසූ ක්‍රියාප්‍රවේශයක් සහතික කෙරෙයි.

(i) **පැමිණිලි ඉදිරිපත් කළ හැකි ක්‍රම**

- පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම්: 0112990990 හෝ 1330 කෙටි කේතය ඔස්සේ.
- ලිඛිත පැමිණිලි: සමාගමේ ප්‍රධාන කාර්යාලයට හෝ ශාඛා කාර්යාලවලට පැමිණිල්ලක්, ලිඛිත ව ඉදිරිපත් කිරීම මගින්.
- පෞද්ගලිකව පැමිණ හමුවීම: සමාගමේ ප්‍රධාන කාර්යාලයට හෝ ඕනෑම ශාඛාවකට පැමිණීම මගින්.
- ආයතනික වට්ස්ඇප් අංකය: ආයතනික වට්ස්ඇප් අංකය වන 0771330000 ඔස්සේ ලිඛිත පැමිණිල්ලක් යොමු කිරීම මගින්.
- ආයතනික විද්‍යුත් තැපෑල: විද්‍යුත් තැපෑල ඔස්සේ info@unionassurance.com වෙත ලිඛිත පැමිණිල්ලක් යොමු කිරීම මගින්.

පැමිණිල්ල ඉදිරිපත් කළ පසු, වැඩකරන දින 3ක් ඇතුළත පැමිණිල්ලට අදාල යොමු අංකයක් සමඟ පැමිණිල්ල ලද බවට දැනුම්දීමක් රක්ෂණ ඔප්පු හිමියා ලැබෙනු ඇත. මෙම යොමු අංකය භාවිතයෙන් පැමිණිල්ලට අදාල කටයුතු සිදුකිරීමේ ක්‍රියාවලිය පුරා සිය පැමිණිල්ල සම්බන්ධ තත්ත්වය ගැන තොරතුරු සොයා බැලීමට රක්ෂණ ඔප්පු හිමියාට ඉඩ සැලසෙයි. සමාගමේ පැමිණිලි කළමණාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය හා සම්බන්ධ වැඩිදුර තොරතුරු www.unionassurance.com වෙත පිවිසීමෙන් ලබාගත හැක.

(ii) **පැමිණිලි නිරාකරණය සඳහා ගත වන කාලය:**

පැමිණිල්ල ලැබුණු දිනයේ සිට වැඩකරන දින 14ක් ඇතුළත පැමිණිල්ල නිරාකරණය කිරීමේ ක්‍රියා පටිපාටිය අවසන් වනු ඇත. යම් හෙයකින් සමාගමට අදාල පැමිණිල්ල නිරාකරණය සඳහා අමතර කාලයක් අවශ්‍යවන අවස්ථාවන්හීදී එයට අදාලවන හේතු සමග විසඳුමක් අපේක්ෂාකල හැකි දිනයක් රක්ෂණ ඔප්පු හිමියා නිසි පරිදි සමාගම මගින් දැනුම් දෙනු ලැබේ.

(iii) **ආරවුල් නිරාකරණය:**

සමාගම විසින් මූලිකව ලබාදෙන ලද විසඳුම සම්බන්ධව රක්ෂණ ඔප්පු හිමියා තෘප්තිමත් නොවන්නේ නම් අදාල පැමිණිලි නිරාකරණය හෝ ප්‍රතිචාරය සමාගම වෙතින් ලැබී සති 4 ක් ඇතුළත විකල්ප ආරවුල් නිරාකරණ ක්‍රමවේදය යටතේ නම්කරනු ලබන නිලධාරියා වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ හැකියාවක් ඇත. එමෙන්ම පැමිණිල්ල නිරාකරණය/ ප්‍රතිචාරය සමාගම වෙතින් ලැබී සති 4 ක් ඇතුලතදී රක්ෂණ ඔප්පු හිමියා විසින් ඊට අදාලව ප්‍රතිචාරයක් නොදැක්වුවහොත් සමාගම විසින් අදාල පැමිණිල්ල නිමාකරන ලද පැමිණිල්ලක් සේ සලකනු ලැබේ.

Specimen

සමාගම විසින් සපයනු ලබන විසඳුම පිළිනොගන්නා අවස්ථාවලදී, පැමිණිල්ල රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා හෝ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම වෙත යොමු කිරීමේ හෝ ශ්‍රී ලංකාව ඇතුළත අධිකරණ හරහා නීතිමය කටයුතු ඇරැඹීමේ අයිතිය රක්ෂණ ඔප්පු හිමියා සතුය. මෙමගින් අපක්ෂපාතී නිරාකරණය සහ නියාමන ප්‍රමිතීන්ට අනුගතවීම සහතික කෙරෙයි.

- **ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම (IRCSL) පිළිබඳ විස්තර:**
  විමර්ශන අධ්‍යක්ෂ
  ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම
  11 වැනි මහල, නැගෙනහිර කුලුණ, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, කොළඹ 01.
  දුරකථන: 0112396184-9 / 0112335167
  ඊමේල්: investigation@ircsl.gov.lk / info@ircsl.gov.lk

- **රක්ෂණ ඔම්බුඩ්ස්මන් කාර්යාලය පිළිබඳ විස්තර:**
  ශ්‍රී ලංකා රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා
  අංක 01, බෙතෙස්ඩා පෙදෙස, මිලාගිරිය, බම්බලපිටිය.
  දුරකථන: 0114528671, 0112505542
  ඊමේල්: info@insuranceombudsman.lk
  වෙබ්: www.insuranceombudsman.lk

## 2.23 ප්‍රාථමික ප්‍රතිලාභය සඳහා වූ සීමාවන්

ප්‍රාථමික ප්‍රතිලාභය සඳහා සුදුසුකම් ලබන සීමා පහත පරිදි වේ

| කාණ්ඩය | අවම (වර්ෂ) | උපරිම (වර්ෂ) |
|---|---|---|
| වයස | 18 | 50 |
| ඔප්පු කාලය | 10 | 10 |

Specimen

**උපලේඛණ අංක 3**

## 3. ජීවිත රක්‍ෂණ අතිරේක ප්‍රතිලාභ

**උපලේඛණ අංක 3.1**

### 3.1 හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය (ADB)

#### 3.1.1 ප්‍රධාන අරමුණු සහ අවශ්‍යතාවය

ඔප්පුවෙහි පළමු උපලේඛණයෙහි II කොටසේ හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය (ADB) ඇතුලත් කර ඇති බවට සඳහන් වේ නම් පමණක් මෙම ප්‍රතිලාභය අදාල වේ.

පහත සඳහන් කොන්දේසි හා විධිවිධාන වලට යටත්ව, ඔප්පුව ප්‍රාණවත්ව පවතී නම්, සහ මෙම ප්‍රතිලාභය සඳහා අදාල වාරික ගෙවා තිබේ නම්, සමාගම සෑහීමකට පත්වන පරිදි රක්ෂිතයාගේ මරණය, හදිසි අනතුරක් නිසා එය සිදුවී, හදිසි අනතුර සිදුවූ දින සිට දින අනුවක් (90) ඇතුලත සිදුවූ බවට සාක්ෂි ඉදිරිපත් කලහොත් පළමු උපලේඛණයේ II කොටසේ ADB යටතේ සඳහන් රක්ෂිත මුදලට සමාන මුදලක් ගෙවනු ලැබේ.

#### 3.1.2 රැකියාවේ වෙනස්වීම් දැන්වීම

ජීවිත රක්ෂිතයාගේ රැකියාවෙහි සැලකිය යුතු වෙනස්වීමක් සිදුවුවහොත් එම වෙනස්වීමේ දින සිට දින දහහතරක් (14) ඇතුලත ඒ බව සමාගම වෙත දැනුම් දී ඒ අනුව මෙම ප්‍රතිලාභය යටතේ ආවරණය වූ අවදානම් නැවත අනුමත කරගත යුතුය. මරණය සිදුවන අවස්ථාවේදී ජීවිත රක්ෂිතයා, යෝජනා පත්‍රයේ/ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් රැකියාවට වඩා වෙනස් වූ රැකියාවක නිරත වීමෙන් පැන නගින්නා වූ හිමිකමක් වෙනුවෙන් වගකීමට සමාගම කිසිසේත් බැඳී නොමැත.

#### 3.1.3 කොන්දේසි

(i) ප්‍රතිලාභ ගෙවීම සලකා බැලීම සඳහා, ජීවිත රක්ෂිතයාගේ හදිසි අනතුරු මරණය සිදුවිය යුත්තේ;

  (අ) මෙහි පළමු උපලේඛණයේ (II) කොටසේ සඳහන් පරිදි මෙම ප්‍රතිලාභය කල්පිරීමේ දිනයට පෙර; හෝ

  ආ) ජීවිත රක්ෂිතයාගේ වයස අවුරුදු හැට (60) සපිරෙන දිනට හෝ ඊට පසු එළඹෙන ඔප්පු සංවත්සර දින යන සිදුවීම් දෙකෙන් පළමු සිදුවීමේ දීය.

(ii) දින තිහක (30) අනුග්‍රහ කාලය ඉකුත් වී ගොස් තවදුරටත් වාරිකය නොගෙවා ඇත්නම් මෙම ප්‍රතිලාභය අක්‍රිය වනු ඇත. මෙම ආවරණය නැවත ප්‍රාණවත් කිරීම හෝ ප්‍රතිෂ්ඨාපනය කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා සමාගමට අයිතියක් ඇත. මෙම ප්‍රතිලාභය සඳහා “ආවරණ හිමි නොවන කාලය” අදාළ වන්නේ නම්, ඔප්පුව ප්‍රාණවත්/ප්‍රතිෂ්ඨාපනය කල දින සිට අදාළ ආවරණය හිමි නොවන කාලය නැවත බලපැවැත්වේ.

(iii) මුල් රක්‍ෂණ ඔප්පුව අවලංගු වන අවස්ථාවක මෙම අතිරේක ප්‍රතිලාභයද අවලංගු වනු ඇත.

(iv) මෙම ප්‍රතිලාභය;

  (අ) ලාභ සඳහා දායක නොවන අතර

  (ආ) පවාරණ, ගෙවානිමි හෝ පූර්ණත්ව අගයකට හිමිකම් නොලබනු ඇත.

(v) තනි පුද්ගලයෙකු විසින් සියළුම රක්‍ෂණ සමාගම් මඟින් මෙම ප්‍රතිලාභය සඳහා උපරිම වශයෙන් හිමිකම් කිව හැක්කේ රුපියල් මිලියන පනහක් (රු.50,000,000) දක්වා පමණයි.

(vi) ජීවිත රක්ෂිතයා මෙම ආවරණය ලබා ගැනීමට සුදුසුකම් නොලබන්නේ නම්, එම ආවරණය ඉවත් කිරීමට සමාගමට අයිතියක් ඇත. තවද ජීවිත රක්ෂිතයාගේ අභිමතය පරිදි මෙම ආවරණය ඉවත්කල නොහැක.

Specimen

### 3.1.4 මෙම ප්‍රතිලාභය සඳහා අදාළ වන බැහැර කිරීම්

මෙම ප්‍රතිලාභය යටතේ හිමිකම් පෑමට හේතුවූ සිද්ධිය හෝ රෝග තත්ත්වය පහත සඳහන් සිද්ධි හෝ සිද්ධීන් එකකට හෝ වැඩි ගණනක සෘජු හෝ වක්‍ර ප්‍රතිඵලයක් වශයෙන් සිදුවී ඇත්නම් මෙම ප්‍රතිලාභය යටතේ කිසිදු හිමිකමක් ගෙවීමට සමාගම බැඳී නොමැත.

(i) තමන් විසින් කරගත් තුවාලයකින් හෝ සියදිවි හානිකර ගැනීමට තැත් කිරීමෙන්; සහ/හෝ

(ii) පමණ ඉක්මවා මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිත කිරීමෙන්, මත්පැන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමෙන් සිදුවන රෝගී තත්ත්වයන්, එමෙන්ම මත්පැන්/මත්ද්‍රව්‍ය භාවිත කර තිබෙන අවස්ථාවක සිදුවන රිය අනතුරු හා අනෙකුත් හදිසි අනතුරකදී; සහ/හෝ

(iii) පිළිගත් ගුවන් සමාගමක ගාස්තු ගෙවන මගියෙකු වශයෙන් හැර ජීවිත රක්ෂිතයා කවර තරාතිරමක හෝ ගුවන් තරණයෙහි හෝ ගුවන් යානයක් හැසිරවීමකදී හෝ ගුවන් යානයක් තුල කාර්යභාරයක් නොමැතිව ඉන් ඉවත්වීමට සිදුවීම නිසා සිදුවන හදිසි අනතුරක් හේතුකොට ගෙන ඇතිවන තුවාල හේතුවෙන්; සහ/හෝ

(iv) යුද්ධයක් හෝ යුද්ධයක් බඳු මෙහෙයුමක් (යුද්ධයක් ප්‍රකාශ කර තිබුණත් නැතත්) සිවිල් යුද්ධයක්, කැරැල්ලක් අභිදෝශයක් කුමන අන්දමේ හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක්, ජන කැළඹීමක්, හමුදාව විසින් හෝ වෙනත් අන්දමකින් හෝ රාජ්‍ය බලය පැහැර ගැනීමක්, කැරලි කෝලාහලයක්, හමුදා කැරැල්ලක්, ආක්‍රමණයක්, විදේශ සතුරන්ගේ ක්‍රියාවක් හෝ නීත්‍යානුකූල අධිබලයකට විරුද්ධව යම් ක්‍රියාවක් හේතුවෙන් ඇතිවන තුවාල; සහ/හෝ

(v) යුද්ධ, නාවුක ගුවන් හෝ පොලිස් හමුදා සංවිධානයක හෝ ඊට සමාන සේවයක යෙදී සිටියදී හමුදා අණමත ත්‍රස්තවාදීන්, රාජ්‍ය විරෝධී ක්‍රියාකාරීන් මැඩ පැවැත්වීමට සහය වීමෙන්; සහ/හෝ

(vi) න්‍යෂ්ටික අනතුරු උදා: න්‍යෂ්ටික බල ශක්තියට නිරාවරණය වීම (විකිරණශීලීතා දූෂණය, න්‍යෂ්ටික බද්ධය, විබද්ධය) හෝ ඕනෑම න්‍යෂ්ටික අපද්‍රව්‍යයක් නිසා හෝ රසායනික දූෂණය හේතුවෙන්; සහ/හෝ

(vii) භයානක නැතහොත් අනතුරුදායක ක්‍රීඩා, නමුත් පහත සඳහන් ක්‍රියාකාරකම් වලට පමණක් සීමා නොවූ දියයට කිමිදීම, මෝටර් රථ ධාවන තරඟ, අහසේ සිට පැරෂුට් මගින් පැනීම, හැංග් ග්ලයිඩින්, කඳු හෝ ගිරි ශිඛර තරණය, දෙපයින් හැර අනෙකුත් ඕනෑම වර්ගයේ ධාවන තරඟ, රාෆ්ටින්, බන්ජී පැනීම, පොතොලින්, දඩයමේ යෙදීම, බාධක අශ්ව තරඟ, පෝලෝ ක්‍රීඩා, හිම ක්‍රීඩා, අයිස් හොකී ක්‍රීඩාවන් හෝ සමාගම ලිඛිතව පිළිගන්නා ලද දෙයකට හැර ඕනෑම අනෙකුත් වෘත්තීමය ගණයට ගැනෙන ක්‍රීඩා වලට සහභාගි වීමෙන්; සහ/හෝ

(viii) ස්වාභාවික අනතුරු පහත සඳහන් ස්වාභාවික අනතුරු වලට පමණක් සීමා නොවූ අයිස් කඳු කඩා වැටීම්, නාය යෑම්, භූමි කම්පා, ගංවතුර, භූමි කම්පා හෝ ගිණිකඳු පිපිරීම් මඟින් ඇතිවන සුනාමි හෝ උදම් රළ තත්ත්වයන්, සුළිසුළං, ධාරානිපාත වර්ෂාව, හරිකේන්, ටෝනාඩෝ හා ටයිෆුන් වැනි ස්වාභාවික විපත්; සහ/හෝ

Specimen

**උපලේඛණ අංක 3.2**

## 3.2 පිළිකා රැකවරණ ආවරණය (CCC)

### 3.2.1 ප්‍රධාන අරමුණු සහ අවශ්‍යතාවය

පිළිකා රැකවරණ ප්‍රතිලාභය අදාල වනුයේ එකී ප්‍රතිලාභය ඇතුළත් කර තිබෙන බවට මෙම ඔප්පුවෙහි පළමුවැනි උපලේඛනයේ II වැනි කොටසේ සඳහන් කර ඇත්නම් පමණි.

ජීවිත රක්ෂිතයා පහත ලැයිස්තුගත කර ඇති පිළිකාවක් ඔහුගේ/ ඇයගේ ජීවිතයේ පළමු වැනි වරට වැළඳී ඇති බවට රෝග නිශ්චය කර තිබෙන්නේ නම් ඔප්පුවේ පොදු නියම සහ කොන්දේසිවලට හා පහත දක්වා ඇත නිශ්චිත නියම සහ කොන්දේසි වලට යටත්ව පළමු වැනි උපලේඛනයේ පිළිකා රැකවරණ ආවරණය යටතේ දක්වා ඇති රක්ෂිත මුදල දක්වා ප්‍රතිලාභ ගෙවනු ලබයි.

පිළිකාවක් බවට රෝග විනිශ්චය කර ඇති විට නිශ්චය කර ඇති පිළිකා අදියර අනුව රක්ෂිත මුදලෙන් ප්‍රතිශතයක් ප්‍රතිලාභය ලෙස ගෙවනු ලැබේ.

| අදියර | ප්‍රතිශතය |
|---|---|
| මූලික අදියරේ පිළිකාව (1 වැනි අදියර) | රක්ෂිත මුදලින් 25% ක් |
| මැද අදියරේ පිළිකාව ( 2 වැනි අදියර) | මූලික අදියරේ පිළිකාව ක් සම්බන්ධයෙන් කලින් ගෙවන ලද කිසියම් හිමිකමක් වේ නම් එය අඩු කර රක්ෂිත මුදලින් 50%ක් |
| පසු අදියරේ පිළිකාව ( 3 වැනි අදියර) | මූලික අදියරේ පිළිකාවක් සහ මැද අදියරේ පිළිකාවක් සම්බන්ධයෙන් කලින් ගෙවන ලද කිසියම් හිමිකමක් වේ නම් එය අඩු කර රක්ෂිත මුදලින් 100 %ක් |

- ප්‍රතිලාභය ගෙවනු ලබන්නේ එක් එක් අදියර සඳහා එක් වරක් පමණි
- මෙම ප්‍රතිලාභය යටතේ ගෙවනු ලබන මුළු මුදල රක්ෂත මුදලින් 100% ක උපරිමයකට යටත් වේ

### 3.2.2 වෛද්‍යාධාර ආවරණය

මැද හෝ පසු අදියර පිළිකාවක් බවට රෝග නිශ්චය කිරීමෙන් හදුනාගත් පසු වෛද්‍යාධාර ආවරණය මාස 12 ක කාලසීමාවක් සඳහා පහත සඳහන් ආකාරයට වාරික වශයෙන් ගෙවනු ලැබේ.

| පිළිකා රැකවරණ ආවරණය (රක්ෂිත මුදල) (රුපියල්) | මාසික වාරිකය (රුපියල්) | ගෙවීම් උපරිමය (රුපියල්) |
|---|---|---|
| 1,000,000 | 20,000 | 240,000 |
| 2,000,000 | 40,000 | 480,000 |
| 3,000,000 | 60,000 | 720,000 |

- ප්‍රතිලාභ ගෙවනු ලබන්නේ රක්ෂණ ඔප්පු කාලය පුරාම එක් වරක් පමණි
- මැද-අදියරේ පිළිකාවක් හඳුනා ගැනීමෙන් පසු වෛද්‍යාධාර ආවරණය ගෙවන අතරතුර ජීවිතරක්ෂකයා පසු- අදියරේ පිළිකාවක් ඇති බව හඳුනාගනු ලැබුවහොත් උපරිම වාරික 12 කට යටත්ව ඉතිරි වාරික ගෙවාගෙන යනු ලැබේ.

Specimen

### 3.2.3 පොරොත්තු කාලසීමාව

ආවරණය ;

(i) ප්‍රතිලාභයේ ආරම්භක දිනය ; හෝ

(ii) ඔප්පුවේ ආරම්භක දිනය ; හෝ

(iii) ඔප්පුවේ ප්‍රකෘතිමත් කිරීමේ දිනය/යථාවත් කිරීමේ දිනයට හෝ

(iv) ප්‍රතිලාභය පසුකාලීනව ඇතුළත් කළේ නම් එසේ ඇතුළත් කළ දිනය යන දිනවලින් අවසානයට එළැඹෙන දිනට දින එකසිය අසූවකට (180) පසුව ආරම්භ වේ.

### 3.2.4 පිළිකා රැකවරණ ආවරණය පිළිබඳ අර්ථ දැක්වීම

I. **මූලික අවධියෙහි පිළිකා** - ස්ථානීය කුලිරමාව (Carcinoma in-situ)

මෙතෙක් ආවෘත පටක ආක්‍රමණය/ විනාශ වීම සිදු නොවූ සම්භූත සෛල වලට සීමා වූ පිළිකා සෛලයන්හි ස්වාධීන කේන්ද්‍රීය නව වර්ධනයන් ස්ථානීය කුලිරමාව ලෙස හැඳින්වේ. ආක්‍රමණය යනු පාදස්ථ පටලය විනිවිදයාම හෝ එයට එපිටින් වූ සාමාන්‍ය පටකයන්හි සක්‍රීය විනාශයයි.

ස්ථානීය කුළිරමාව රෝග විනිශ්චය සෑම විටම ඖත වේදි වාර්තාවක් මගින් තහවුරු කළ යුතුය. ස්ථාවර පටකයන්හි අන්වීක්ෂීය පරීක්ෂාවෙන් එළඹෙන ධනාත්මක රෝග නිශ්චය තවදුරටත් වානු පරීක්ෂාවක් මඟින් සනාථ කළ යුතුය.

සායනික රෝග නිශ්චය මේ යටතේ බැහැර කෙරේ.

ගර්භාෂ ග්‍රීවය හා සම්බන්ධ තත්ත්වවලදී පැප් පරීක්ෂාවක් පමණක් ප්‍රමාණවත් නොවන අතර එය කොලොස්කොපි වාර්තාවක් සමඟ වානු පරීක්ෂාවක් හෝ කෝන් වානු වාර්තාවක් මගින් තහවුරු කළ යුතුය.

සායනික රෝග නිශ්චය හෝ ස්ථානීය කුළිරමාවක් නොවන උග්‍ර ඩිස්ප්ලේසියාව (CIN 1, CIN 2, CIN 3) හා ග්‍රීව අන්තඃ අපිච්ඡද නව්‍ය ප්ලාස්මාව මෙම නිර්වචනයට යටත් නොවන අතර විශේෂයෙන් බැහැර කෙරේ.

මෙලනෝමා නොවන චර්ම කුලිරමාවන් ද විශේෂයෙන් බැහැර කෙරේ.

මෙම ආවරණය මුල්වරට ඇතිවූ කුලිරමාවන් සඳහා පමණක් වලංගුවේ.

TNM වර්ගීකරණයට අනුව ඖතවේදිව T1N0M0 ලෙස විස්තර කෙරෙන පුරස්ථි ග්‍රන්ථි පිළිකා

TNM වර්ගීකරණයට අනුව ඖතවේදිව T1N0M0 ලෙස විස්තර කෙරෙන තයිරොයිඩ් ග්‍රන්ථි පිළිකා

TNM වර්ගීකරණයට අනුව T1N0M0 ලෙස ඖත වේදිව විස්තර කෙරෙන මුත්‍රාශ පිළිකා

RAI වර්ගීකරණයට අනුව හා RAI ALL 0 ශ්‍රේණියේ නිදන් ගත ලිම්පොසයිටික ශ්වේත රක්තිය සහ ට පහළ ශ්‍රේණි බැහැර කෙරේ.

Clark 3 මට්ටමේ ලෙස හෝ ඖත වේදිව ස්ථානීය කූලිරමාවක් ලෙස විස්තර කෙරෙන ආක්‍රමණශීලී නොවන මෙලනෝමාවන් සහ ක්‍රමණශීලී වුවත් 1.5 mm අඩු මෙලනෝමාවන්ද බැහැර කෙරේ.

මානව ප්‍රතිශක්තීකරණ ඌනතා වෛරසය (HIV) යටතේ වැළඳෙන සියලු වර්ගවල කුලිරමාවන්ද බැහැර කෙරේ.

II. **මධ්‍ය අදියරෙහි පිළිකා** (අත්‍යන්ත ශල්‍යකර්ම මගින් ප්‍රතිකාර කෙරෙන ස්ථානීය කුලීරමාවන් හා වෙනත් මූලික අවධියෙහි පිළිකා)

මෙහිදී නිශ්චිත අවයවයක මාත්සර්ය සෛල පැතිරීම වැළැක්වීම සඳහා සුදුසුම හා අත්‍යවශ්‍ය ප්‍රතිකාරය ලෙස තථ්‍ය අත්‍යන්ත ශල්‍යකර්මයකට භාජනය වීම සැලකෙන අවස්ථාව යි.

- පූර්ණ ශල්‍යමය ඉවත් කිරීම, පියයුරු (පූර්ණ මැස්ටෙක්ටොමි), පුරස්ථ ග්‍රන්ථි (පූර්ණ ප්‍රොස්ටෙක්ටොමි), ගර්භාෂය (පූර්ණ හිස්ටෙරැක්ටොමි), ඩිම්බෝකෝෂ (පූර්ණ ඌපෙරැක්ටොමි), පැලෝපීය නාල (පූර්ණ සලෙපින්ජියොටොමි ), මුත්‍රශය (පූර්ණ සිස්ටෙක්ටොමි).

Specimen

● දෙකොන් ප්‍රාතිමුඛිතය සිදුකරමින් පහත අවයවයන්හි අර්ධ ඉවත් කිරීම, මහා අන්ත්‍ර (පාර්ශ්වික කොලෙක්ටොමි), ආමශය (පාර්ශ්වික ගැස්ට්‍රෙක්ටොමි) ,ආමාශය හා න් අන්ත්‍රය හැරුණු කොට පියයුරු පුඝඤ්ඤ (ගැටිති) තයිරොයිඩ් ග්‍රන්ථිය හා පුරස්ථ ග්‍රන්ථිය සඳහා සිදු කෙරෙන පාර්ශ්වික ශල්‍යකර්ම මේ යටතේ සලකා නොබැලේ.

● මෙතෙක් ආවෘත පටක ආක්‍රමණය/ විනාශ වීම සිදු නොවූ සම්භූත සෛල වලට සීමා වූ පිළිකා සෛලයන්හි ස්වාධීන කේන්ද්‍රීය නව වර්ධනයන් ස්ථානීය කුලිරමාව ලෙස හැඳින්වේ ආක්‍රමණය යනු පාදස්ථ පටලය විනිවිදයාම හෝ එයට එපිටින් වූ සාමාන්‍ය පටකයන්හි සක්‍රීය විනාශයයි. ස්ථානීය කුළිරමාව රෝග විනිශ්චය සෑම විටම ඖත වේදි වාර්තාවක් මගින් තහවුරු කළ යුතුය. ස්ථාවර පටකයන්හි අන්වීක්ෂීය පරීක්ෂාවෙන් එළඹෙන ධනාත්මක රෝග නිශ්චය තවදුරටත් වානු පරීක්ෂාවක් මඟින් සනාථ කළ යුතුය. සායනික රෝග නිශ්චය මේ යටතේ බැහැර කෙරේ.

● පූර්ණ පුරස්ථිතික විච්ඡේදනයක් මගින් ප්‍රතිකාර කරන ලද T N M වර්ගීකරණය යටතේ T1M0N0 ලෙස ඖතවේදිකව විස්තර කෙරෙන මූලික පුරස්ථතික පිළිකා ආවරණය කෙරේ. පූර්ණ පුඝඤ්ඤ විච්ඡේදනයක් මගින් ප්‍රතිකාර කරන ලද T N M වර්ගීකරණය යටතේ T1M0N0 ලෙස ඖතවේදිකව විස්තර කෙරෙන මුත්‍රාශයෙහි පිළිකා මෙහිදී ආවරණය කෙරේ. සියලු ම ශ්‍රේණි වල පුරස්ථිතික අන්තං අපිච්ඡද නව්‍ය ප්ලාස්මමාවන් සහ සියලු අදියරයන්හි ග්‍රවීය අන්තං අපිච්ඡද නව්‍ය ප්ලාස්මාවන් (ස්ථානීය කුලීරමාවන් නොවන උග්‍ර ඩිස්ප්ලේෂියාවන්)විශේෂයෙන් බැහැර කෙරේ. අමතරව HIV ආසාදනයක් යටතේ හට ගත් කුලිරමාවන්ද බැහැර කෙරේ.

III. **පසු අවධියෙහි පිළිකා**

පටක ආක්‍රමණය හා පාලනය කළ නොහැකි මාත්‍යසර්ය සෛල වර්ධනයක් විදහා දක්වන ඖතිකවෙදික පරීක්ෂණවලින් ධනාත්මකව තහවුරු කරන ලද අර්බුදයන් මේ යටතට ගැනේ. ශ්වේත රක්තය ලිම්ෆොමාව හා පිශ්‍රිතමාව (Melanoma ) ද මාත් සරික අර්බුදයන් සේ සැලකේ.

මෙම නිර්වචනයෙන් පහත සඳහන් තත්ත්වයන් ආවරණය නොවේ.

(i) මතු දැක්වෙන අවස්තා සේ ඖත වේදිකව වර්ගීකරණය කරන ලද ඕනෑම තත්ත්වයක්
- පූර්ව මත්ස්‍ය අර්බුද
- ආක්‍රමණශීලී නොවන අර්බුද
- ස්ථානික කුළිරමාවන්
- සීමාසන්න මාත්සරික තත්ත්ව
- මාත්සරික විභවයක් ඇති තත්ත්ව

(ii) T1N0M0 ලෙස ඔහළු වර්ගීකරණයට අනුව වර්ග කරන ලද පුරස්ථ ග්‍රන්ථි පිළිකා

(iii) T1N0M0 ලෙස ඔහළු වර්ගීකරණයට අනුව වර්ග කරන ලද තෛරොයිඩ් ග්‍රන්ථි පිළිකා

(iv) T1N0M0 ලෙස ඔහළු ලෙස වර්ගීකරණයට අනුව වර්ග කරන ලද මුත්‍රාශයෙහි පිළිකා

(v) RAI III අවස්ථාවට අඩු නිදන්ගත ශ්වේත රක්තිය

(vi) මානව ප්‍රතිශක්තීකරණ ඌනතා වෛරසය යටතේ ඇතිවන ඕනෑම පිළිකාවක්

(vii) මාත්සරික මෙලනෝමා හැරුණු කොට අනෙකුත් සියලුම චර්ම පිළිකා

**3.2.5 වාර මුදල් හා කොන්දේසි සංශෝධනය කිරීම**

මෙම ප්‍රතිලාභය සඳහා ගෙවිය යුතු වාරිකය මෙම ප්‍රතිලාභය ආරම්භ කිරීමේ දිනයෙන් එක් (01) වසරක කාලසීමාවක් සඳහා පමණක් වලංගු වේ. ඔප්පුවේ සෑම වසරකදීම අදාළ වන වාරික අනුපාත සංශෝධනය කිරීමේ සහ/හෝ නියම සහ කොන්දේසි වෙනස් කිරීමේ අයිතිය සමාගම සතු වේ. එවැනි වෙනස්කම් ක්‍රියාත්මක වන්නේ ඔප්පු හිමියාට දින තිහක (30)ක දැන්වීමකින් පසුව පමණක් වන අතර දැන්වීමට පසුව එළඹෙන ඔප්පු සංවත්සරයේ සිට ක්‍රියාත්මක වනු ඇත.

Specimen

### 3.2.6 රැකියාව වෙනස්වීම පිළිබඳ දැන්වීම

ජීවිත රක්ෂිතයාගේ රැකියාව සහ රාජකාරී ස්වභාවය සම්බන්ධයෙන් සිදු වන ඕනෑම වැදගත් වෙනස්වීමක් එවැනි වෙනස්වීමක් සිදු වී දින දාහතරක් (14) ඇතුළත සමාගමට දැනුම් දිය යුතු වන අතර මෙම ඔප්පුව යටතේ ඇති ප්‍රතිලාභය සමාගම මඟින් නැවත අනුමත කරවා ගැනීමට අවශ්‍ය වේ. ජීවිත රක්ෂිතයා යෝජනාවේ/ අයදුම්පත්‍ර ආකෘතියේ සහ/හෝ සෞඛ්‍ය ප්‍රකාශනයේ සඳහන් කර ඇති රැකියාවට වඩා සැලකිය යුතු ලෙස වෙනස් රැකියාවක නිරත වී සිටින අතරතුර පැනනැඟිය හැකි කිසියම් හිමිකමක් සම්බන්ධයෙන් සමාගම වගකියනු නොලැබේ.

### 3.2.7 හිමිකම් ඉල්ලා සිටීමේ ක්‍රියාපටිපාටිය

හිමිකමක් ඉල්ලුම් කිරීමේ දී පදනම් විය හැකි පිළිකාවක් රෝග නිශ්චයක් කළ ලිඛිත දැන්වීම සමාගමට එවිය යුතු වන අතර එවැනි දැන්වීමක්, ජීවිත රක්ෂිතයාගේ එවකට ලිපිනය සහ වර්තමානයේ ජීවත්වන ස්ථානය සමඟ, එවැනි රෝගයක් වැළඳී ඇති බවට රෝග නිශ්චය කළ දිනයේ සිට අවම වශයෙන් දින තිහක් (30)ක් ඇතුළත, සමාගමේ ප්‍රධාන කාර්යාලයට යොමු කළ යුතුය. එවැනි කාලයක් ඇතුළත දැනුම් දීමට අපොහොසත්වීම හේතුවෙන් එවැනි හිමිකම් ඉල්ලීමක් භාර නොගැනීමට සමාගමට අයිතියක් ඇත. පිළිකාවක් වැළඳී ඇති බව සනාථ කරන සාක්ෂි කිසිදු වියදමක් නොමැතිව සමාගම වෙත භාර දිය යුතුය.

### 3.2.8 කොන්දේසි

(i) මෙම පිළිකා රැකවරණ ආවරණය
(අ) පළමු වැනි උපලේඛනයේ II වැනි කොටසේ දක්වා ඇති පරිදි මෙම ප්‍රතිලාභය අවසන් වන දිනයේ දී හෝ
(ආ)ඔප්පු සංවත්සර දිනය හෝ ජීවිත රක්ෂිතයාගේ 60 වැනි උපන් දිනය යන දිනවලින් කලින් එළැඹෙන දිනයේ දී සහ/හෝ අවසාන වේ.

(ii) වාරිකය නොගෙවා ඇති විට, දින තිහක (30) ක සහන කාලය ඉකුත් වීමෙන් පසුව මෙම ප්‍රතිලාභය අවලංගු වේ. මෙම ප්‍රතිලාභය ප්‍රකෘතිමක් කිරීම හෝ යථා තත්ත්වයට පත් කිරීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සමාගම සතු වේ. ප්‍රතිලාභය ප්‍රකෘතිමත් කිරීම හෝ යථා තත්ත්වයට පත් කිරීම සිදු කළ විට, ප්‍රකෘතිමත් කළ/ යථා තත්ත්වයට පත් කළ දිනයේ සිට පොරොත්තු කාලය අදාළ වනු ඇත.

(iii) ප්‍රධාන ඔප්පුව අවසාන කරන්නේ නම් ප්‍රතිලාභය ද අවසාන වනු ඇත.

(iv) මෙම රයිඩර් ප්‍රතිලාභයට
(අ) ලාභයක් හෝ
(ආ) පවාරණ අගයක්, ගෙවා නිම කළ අගයක් හෝ කල්පිරීමේ අගයක් හිමි නොවේ.

(v) පිළිකාව විශේෂඥ වෛද්‍යවරයෙක් විසින් රෝග නිශ්චය කළ යුතු වන අතර සායනික සහ සමාගම මඟින් පිළිගන්නා වෙනත් වාර්තාවලින් තහවුරු කළ යුතුය.

(vi) පිළිකාවකින් පෙළෙන බවට රෝග නිශ්චය කර ඇති ජීවිත රක්ෂිතයා පරීක්ෂා කිරීමට විශේෂඥ වෛද්‍යවරයෙක් හෝ වෛද්‍යවරුන් පත් කිරීමේ අයිතිය සමාගම සතු වේ.

(vii) පසු අවධියේ පිළිකාවක් සඳහා හිමිකම් ඉල්ලීමක් සඳහා ගෙවීමෙන් පසුව රක්ෂණ ප්‍රතිලාභය අවසාන වන අතර වාරිකය අඩු කරනු ලැබේ. ජීවිත රක්ෂිතයා ජීවත්ව සිටින්නේ නම්, අනෙකුත් ප්‍රතිලාභ සඳහා වාරික අඛණ්ඩව ගෙවිය යුතුය.

(viii) පැවරුම්ලාභියාට, නාමිකයාට හෝ ප්‍රතිලාභියාට මෙම උපලේඛනයේ දක්වා ඇති ප්‍රතිලාභ යටතේ කිසිදු ගෙවීමක් ලැබීමට අයිතියක් නොමැත.

(ix) වෛද්‍යාධාර ප්‍රතිලාභය හැරුණු කොට, මෙම ප්‍රතිලාභය සඳහා සමාගමෙන් තනි පුද්ගලයෙක්ට ගෙවනු ලබන බවට සහතික කර ඇති උපරිම මුදල රුපියල් මිලියන තුනක් (රු.3,000,000)කට සීමා කර ඇත.

Specimen

(x) වෛද්‍යාධාර ප්‍රතිලාභය යටතේ සියලුම වාරික සම්පූර්ණ කිරීමට පෙර, මරණය හේතුවෙන් හිමිකම් ඉල්ලීම හෝ කල්පිරීම හේතුවෙන් ඔප්පුව අවසාන වන්නේ නම්, නොගෙවූ වාරිකවල එකතුව හිමිකම සමඟ ගෙවනු ලැබේ. මරණයක දී එම මුදල ප්‍රතිලාභියට ගෙවනු ලබන අතර කල්පිරීමේ දී එම මුදල ඔප්පු හිමියාට ගෙවනු ලැබේ.

### 3.2.9 මෙම ප්‍රතිලාභයට අදාළ බැහැර කිරීම්

ජීවිත රක්ෂිතයාගේ රෝගය සෘජුව හෝ වක්‍රව පහත දැක්වෙන කරුණු හේතුවෙන් හෝ ඒ හා සම්බන්ධ හේතුවන් නිසා පිළිකාව වැළදී තිබෙන්නේ නම් පිළිකා රැකවරණ ආවරණය යටතේ කිසිදු ගෙවීමක් කිරීමට සමාගම බැඳී නොසිටී

(i) සිය දිවි නසා ගැනීමට තැත් කිරීමෙන් හෝ චේතාන්විතව සවයං හානි සහ/හෝ
(ii) ජීවිත රක්ෂිතයා මත්පැන්, මත්ද්‍රව්‍ය, අන්තරායකාරී ඖෂධ හෝ විෂ පානය හේතුවෙන් හෝ විෂ වායු හෝ විෂ දුමාරය ආඝ්‍රානය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස. සහ/හෝ
(iii) (ඔප්පු තොරතුරු ප්‍රකාශනයේ සඳහන් කර ඇති පරිදි) ඔප්පු දිනයට හෝ මෙම ඔප්පුව ප්‍රකෘතිමත් කිරීමට පෙර කලින් පැවති රෝගයක් හේතුවෙන් සහ/හෝ
(කලින් පැවති රෝගයක් යන්නෙන් ජීවිත රක්ෂිතයා යුක්තිසහගතව දැන සිටින තත්වයන් අදහස් වේ.

අදාළ තත්ත්වය පහත දක්වා ඇති තත්ත්වයක් වන්නේ නම් ජීවිත රක්ෂිතයා කලින් පැවති රෝගයක් පිළිබඳ යුක්තිසහගතව දැන සිටි බවට සලකනු ලැබේ:-

-ජීවිත රක්ෂිතයා ප්‍රතිකාර ලබා ඇති හෝ ප්‍රතිකාර ලබන තත්ත්වයක්;
-වෛද්‍ය උපදෙස්, රෝග නිශ්චය, රැකවරණය හෝ ප්‍රතිකාර නිර්දේශ කර ඇති තත්ත්වයක්;
-පැහැදිලි සහ නිශ්චිත රෝග ලක්ෂණ තිබෙන හෝ තිබී ඇති තත්ත්වයක්;
-එම වාතාවරණය තුළ යුක්තිසහගත තැනැත්තෙක්ට එම තත්ත්වයේ පැවතීම පෙනී යන තත්ත්වයක් සහ/හෝ

(iv) යුද්ධයක් අතරතුර සහ යුධ, ආක්‍රමණ, විදේශීය සතුරෙක්ගේ ක්‍රියාවක්, (යුද්ධය ප්‍රකාශ කර ඇති හෝ නොමැති තත්ත්වයක් තුළ) එදිරිවාදිකම් සහ යුධමය වැනි ක්‍රියාවන්, සිවිල් යුද්ධය, කැරැල්ල, හමුදා කැරැල්ල, විප්ලවය, කිසියම් මහජන, සන්නද්ධ හමුදා හෝ ගුවන් හමුදාවල නාවුක හෝ යුධ හමුදා මෙහෙයුම්වලින් නියෝගවලින් රාජසන්තක කිරීම හෝ ජනසතුකරණය සහ අවිආයුධ භාවිතා කිරීම අවශ්‍ය වන මෙහෙයුම්වලට සහභාගීවීම හෝ ත්‍රස්තවාදීන්ට, අරගලකරුවන්ට හෝ එවැනි අයට විරුද්ධව සටන් කිරීමට හමුදා අධිකාරීන් මඟින් නියෝග කළ යුද්ධ වැනි ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස වන පිළිකා; සහ/හෝ
(v) දිය යට කිමිදීම, යතුරුපැදි පැදීම, පැරෂුට් පැදීම, එල්ලී පාවීම, කළුගල් හෝ කඳු නැගීම, පයින් හැරුණු කොට වෙනත් ආකාරයකින් රේසින් පැදීම, ඔරු පැදීම, බංගී පැනීම, වළ හැරීම ඇතුළු නමුත් ඒවාට සීමා නොවූ අන්තරාදායක ක්‍රියාකාරකම් හෝ සමාගම සමඟ ලිඛිතව එකඟ වී ඇත්තේ නම් මිස, වෘත්තීය මට්ටමකින් කිසියම් ක්‍රීඩාවක නිරතවීම; සහ/හෝ

(vi) නතුකර ගත් ප්‍රතිශක්තිකරණ ඌනතා රෝගය (“AIDS”) වැළඳී තිබීම හෝ මානව ප්‍රතිශක්ති ඌනකාරක වෛරසය (“HIV”) ආසාදනය වී තිබීම

(vii) කිසියම් න්‍යෂ්ටික ඉන්ධනයකින් හෝ න්‍යෂ්ටික අපද්‍රව්‍යයකින් හෝ න්‍යෂ්ටික විඛණ්ඩන ක්‍රියාවලියෙන් හෝ කිසියම් න්‍යෂ්ටික ආයුධ ද්‍රව්‍යවලින් විකිරණ අයනීකරණය හෝ විකිරණ දූෂණයට ලක්වීම

(viii) මෙහි අර්ථ දක්වා ඇති පරිදි පිළිකාවක් වැළඳී ඇති බවට රෝග විනිශ්චය කිරීම හැරුණු කොට කිසියම් රෝගයක් හෝ ශල්‍යකර්මය

Specimen

**උපලේඛන අංක 4**

## 4. මෙම රක්ෂණ ඔප්පුව සඳහා අදාල වන නිර්වචනයන්

### 4.1 මූලික නිර්වචන

**"වෙනස් කිරීම"**

ඔප්පුවෙහි ප්‍රතිපාදනයන්ට අතිරේක හෝ විකල්ප සංශෝධනයන්/වෙනස් කිරීම් අමුණා ඇති සටහන්; වෙනස් කිරීම් බල පැවැත්වෙන්නේ සමාගම නිළ වශයෙන් ඒ සඳහා අත්සන් කොට ඔප්පු හිමියා විසින් එය බාරගත් පසුවය.

**"යෝජකයා"**

රක්ෂණ යෝජනා පත්‍රයක් සම්පූර්ණ කොට අත්සන් තබා රක්ෂණ ඔප්පුවක් සඳහා ඉල්ලුම් කරන තැනැත්තා.

**"යෝජනා පත්‍රය"**

මෙම ඔප්පුව ලබාගැනීම සඳහා ඉල්ලුම් කල පෝරමය. ගිවිසුම පදනම් කර ඇත්තේ මෙහි සඳහන් කළ කරුණු මතය.

**"මූලික රක්ෂිත මුදල"**

ජීවිත රක්ෂිතයාගේ අභාවයේදී ඔප්පුව යටතේ ගෙවනු ලබන අවම මුදල.

**"ප්‍රතිලාභය"**

සමාගම සමඟ ඇති රක්ෂණ ගිවිසුමට අනුව රක්ෂිතයා/යන් වෙත ලැබීමට අයිතිය ඇති සේවා/ප්‍රතිලාභ ප්‍රමාණය.

**"හිමිකම්පාන්නා"**

ඔප්පුව යටතේ ලබාගත හැකි කිසියම් ප්‍රතිලාභයක් සඳහා හිමිකම්පෑමට අදහස් කරන ඔප්පු හිමියා, නාමිකයා, පැවරුම්ලාභියා හෝ වෙනත් නීතිමය අයිතියක් ඇති පුද්ගලයකු (උදා:- මියගිය ඔප්පු හිමියාගේ උරුමකරුවකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ පොල්මංකරුවකු)

**"සමාගම"**

යූනියන් ඇෂුවරන්ස් පී.එල්.සී (සමාගම් පී.කිවු 12) අදහස් වේ.

**"ආවරණය"**

ඔප්පුවට අදාළ කොන්දේසි හා නියමයන්, සීමාකිරීම් හා බැහැර කිරීම් වලට යටත්ව එම ඔප්පුව මඟින් ලබාදෙන ප්‍රතිලාභයට/ප්‍රතිලාභ වලට හිමිකම් පෑම සඳහා රක්ෂිත පුද්ගලයාට ඇති අයිතිය. ප්‍රතිලාභ/ය ලබාදිය යුත්තේ,

(1) ඔප්පුව බලාත්මකව පවතින විටදී; සහ

(2) කිසියම් අහෝසි කිරීමේ කොන්දේසි දිනයකට පෙරාතුව; සහ

(3) ඔප්පුවේ දක්වා ඇති පරිදි හිමිකම් ලබන්නා ආවරණය ලබා ඇති පුද්ගලයකුවේ නම් සහ හිමිකම/ම් සඳහා සියලු අවශ්‍යතාවයන් සම්පූර්ණ කර තිබේනම් පමණි.

**"ආවරණය ලැබූ පුද්ගලයා"**

ඔප්පුව යටතේ ආවරණය බලාත්මකව පවතින කාලය තුළ ප්‍රතිලාභ හිමිවන ඔප්පු හිමියා හෝ ඔප්පු හිමියාගේ යැපෙන්නා.

**"ආරම්භක දිනය"**

රක්ෂණ ගිවිසුම ආරම්භ වන දිනය.

**"කල්පිරීමේ දිනය"**

රක්ෂණ ගිවිසුම අවසන් වන දිනය. මෙදිනෙන් පසුව තව දුරටත් ඔප්පුව බලාත්මකව නොපවතී.

Specimen

**"ඔප්පුවේ දිනය/නිකුත් කළ දිනය"**

ඔප්පුව යටත් යෝජකයා ඔප්පු හිමියකු ලෙස පිළිගත් දිනය.

**"යැපෙන්නෙකු"**

රක්ෂණ ඔප්පු හිමියාගේ නීත්‍යානුකූලව විවාහ වූ කලත්‍රයෙකු, ඔප්පු හිමියාගේ අවිවාහක යැපෙන්නෙකු හෝ ඔප්පු හිමියාගේ කලත්‍රයෙකු (ස්වාභාවික දරුවෙකු, සුළු දරුවෙකු හෝ නීත්‍යානුකූලව හදාගත් දරුවෙකු ඇතුළුව) මාස හයකට (06) වැඩි විය යුතුය.

සමාගම වෙනත් විධිවිධාන අනුමත කරන්නේ නම් මිස, කලත්‍රයාගේ හෝ අවිවාහක යැපෙන්නෙකුගේ ප්‍රධාන පදිංචි ස්ථානය ඔප්පු හිමියා සමඟ තිබිය යුතුය. "යැපෙන්නෙකු" යන පදයට අවුරුදු දහඅට (18) ට වැඩි අවිවාහක යැපෙන්නෙකු ඇතුළත් නොවේ.

**"තහවුරු ප්‍රකාශණය"**

ඔප්පුවේ අඩංගු නියමයන් හා කොන්දේසි වල කිසියම් වෙනස්වීමක් හෝ වෙනස් කිරීමක් කර ඇත්නම් එම වෙනස/වෙනස්කම් ඇතුළත් කරමින් එකී රක්ෂණ ඔප්පුවට කරනු ලබන ඇමුණුම.

**"බැහැර කිරීම්"**

ඔප්පුවෙන් ආවරණය නොවන අවස්ථා සහ ප්‍රතිලාභ.

**"කල් ඉකුත්වීමේ දිනය"**

ඔප්පුව යටතේ ලබා දී ඇති ආවරණ සහ ප්‍රතිලාභ අහෝසිවන දිනය.

**"අනුග්‍රාහ කාල සීමාව"**

වාරිකයක් ගෙවීමට නියමිත දිනයේ සිට එම වාරිකය ගෙවීම සඳහා සමාගම විසින් ලබාදෙනු ලබන අතිරේක සහන කාලය වේ. අනුග්‍රාහ කාලය තුළ වාරිකය ගෙවනු ලබන්නේ නම් නියමිත දිනට වාරිකය ගෙවූ සේ සලකනු ලබන අතර අනුග්‍රාහ කාලසීමාව තුළ රක්ෂණ ඔප්පුව බලාත්මකව පවතී.

**"ආයෝජන ගිණුම"**

මෙම ඔප්පුව සඳහා සමාගම විසින් නාමිකව පිහිටුවා පවත්වාගෙන යනු ලබන පුද්ගල ගිණුම.

**"ජීවිත රක්ෂිතයා"**

මෙම ඔප්පුව යටතේ ජීවිතය රක්ෂණය කර ඇති පුද්ගලයා ලෙස ඔප්පුවේ පළමු උපලේඛණයේ නම සඳහන් කර ඇති තැනැත්තාවේ. විශේෂයෙන් නමක් සඳහන් කර නැති අවස්ථාවකදී ඔප්පු හිමියා ජීවිත රක්ෂිතයා ලෙස සැලකේ.

**"නාමිකයා"**

2000 අංක 43 දරණ රක්‍ෂණ කර්මාන්ත පාලන පණතේ 43 වන කොටස (සෘෂෂ ්ඣ) සහ සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි 544 වන කොටස අනුව ඔප්පු හිමියා විසින් තම මරණයෙන් පසුව ප්‍රතිලාභ ලැබීමට සුදුසු පුද්ගලයා ලෙස සමාගම වෙත ලිඛිතව නම් කිරීමෙන් පසුව සමාගම විසින් පිළිගන්නා ලද තැනැත්තා.

**"ඔප්පුව"**

රක්‍ෂණ ගිවිසුමට අදාළ වන පාලන කොන්දේසි, වරප්‍රසාද හා බැහැරකිරීම් අඩංගු වන ලියවිල්ල.

**"ඔප්පු හිමියා"**

මෙම ඔප්පුව යටතේ ඇති සියලු අයිතිවාසිකම්, වරප්‍රසාද හා විකල්පයන් භුක්ති විඳීමේ අයිතිය ඇති පුද්ගලයා වේ.

**"ඔප්පු වර්ෂය"**

ඔප්පුවේ ආරම්භක දිනයෙන් පටන් ගන්නා අවුරුද්ද හෝ එතැන් සිට එලඹෙන ඔප්පු සංවත්සරය අදහස් වේ.

Specimen

**"පෙර පැවති තත්ත්වයන්"**

රක්ෂණ ආවරණය ආරම්භ කිරීමට පෙර කිසියම් අවස්ථාවක ඇති වූ, වෛද්‍ය ප්‍රතිකාර හෝ වෛද්‍ය උපදෙස් ලබාගත් හෝ ලබා නොගත් කිසියම් සෞඛ්‍යමය හෝ ඒ හා අදාළ තත්ත්වයන් (අසනීප, රෝග ලක්ෂණ, ප්‍රතිකාර ගැනීම් හා වේදනා★ මින් අදහස් වේ. ඔප්පු හිමියා, රක්ෂිතයා සහ යැපෙන්නන් දැනගත යුතු, දැන සිටි හෝ දැන සිටියේ යැයි සාධාරණ ලෙස උපකල්පනය කළ හැකි එවැනි තත්ත්වයක් හෝ අදාළ තත්ත්වයක් පෙර පැවති තත්ත්වයක් ලෙස සැලකේ. ඉල්ලුම් පත්‍රය අත්සන් කළ අවස්ථාවේ සිට සමාගම මඟින් එය පිළිගැනීම තහවුරු කළ අවස්ථාව දක්වා ඇතිවන තත්ත්වයන්ද පෙර පැවති තත්ත්වයන් ලෙස ඒ සමානවම සැලකේ.

**"වාරිකය"**

ඔප්පුවේ ආවරණය බල පවත්නා ගැනීම සඳහා ඔප්පු හිමියා විසින් කොටස් වශයෙන් නිත්‍ය වාරික ලෙස හෝ එකවර ගෙවිය යුතු වාරිකය.

**"මූලික ප්‍රතිලාභය"**

ප්‍රධාන ඔප්පුව යටතේ ලබාදෙන ප්‍රතිලාභයයි. ජීවිත රක්ෂිතයාගේ මරණයේ දී හෝ ඔප්පුව කල්පිරීමේ දී ගෙවන මුදල.

**"උපලේඛණය"**
රක්‍ෂණ ගිවිසුමෙහි සාක්ෂියක් ලෙස සමාගම මඟින් නිකුත් කරනු ලබන ඔප්පු ලේඛනයේ කොටසකි.

**"රක්ෂිත මුදල"**
මරණය, ආබාධිතභාවය, බරපතල රෝගාබාධ, සැත්කම් වැනි අදාළ සිදුවීමකදී ගෙවිය යුතු උපරිම මුදල.

**"ඔප්පුවේ කාලය"**

ඔප්පුව විසින් ආවරණය ලබාදෙන කාල සීමාව.

**"ආවරණය හිමි නොවන කාලය"**
ඔප්පුව ආරම්භක දිනයෙන් හෝ ලියාපදිංචි කරන ලද දිනයෙන් පටන් ගෙන අලුතින් ආවරණය ලැබූ තැනැත්තාට ඔප්පුව යටතේ යම් නිශ්චිත සෞඛ්‍ය තත්ත්වයන් හෝ ප්‍රතිකාර වර්ගයන් සඳහා ආවරණය ලබා නොදෙන කාල පරිච්ඡේදය.

**4.2 අතිරේක ප්‍රතිලාභ සඳහා අදාල වන මූලික නිර්වචන**

**"හදිසි අනතුර"**

ශාරීරික තුවාල ඇතිකරන්නාවූත්, සැහැසිවූත්, අනපේක්ෂිතවූත්, ස්වේඡ්චාවෙන් තොරවූත්, බාහිරව සිදුවන්නාවූත්, දෘෂ්‍යමානවූත් සහ පැහැදිලි හේතුවක් ඇතිව හෝ නැතිව සිදුවන ක්‍රියාවක් හෝ ක්‍රියාදාමයක්.

**"හදිසි අනතුරු මරණය"** යනු

(i) හදිසි අනතුරක් නිසා ඇති වූ ශාරීරික තුවාල හේතුවෙන් සිදුවන සහ

(ii) නිශ්චිතවම හා සෘජුවම එකී ශාරීරික තුවාල හේතුවෙන් පමණක්, වෙනත් කිසිදු හේතුවක් නිසා නොවන, සහ

(iii) එවැනි හදිසි අනතුරක් සිදු වූ දින සිට දින අනූවක් (90) ඇතුළත, ආවරණය පවතින කාලය තුළ සිදු වූ මරණයකි.

**"ශාරීරික තුවාල"** යනු

දියේ ගිලීම් සහ ශරීර අභ්‍යන්තරයේ ඇති වූ තුවාල යන අවස්ථාවන් හැර තැල්මක්, සීරීමක් වැනි බාහිර සලකුණු මඟින් තහවුරු වන්නා වූ තුවාල අදහස් වේ.

**"සංජානීය රෝග"**

පාරම්පරික සාධක නිසා හෝ ගර්භණී කාලයේදී ඇති වන සංකූලතා හේතුවෙන්, උපන් අවස්ථාවේ පටන් පැවති

specimen

රෝගාබාධයක්/අසාමාන්‍යතාවයක්/අබලතාවයක් හෝ ඉන් පසුව පුද්ගලයෙකුගේ ජීවිත කාලය තුළ ඕනෑම අවස්ථාවක අනාවරණය කරගත් එවැනි තත්ත්වයක්.

**"රෝගය"**

සාමාන්‍ය ශාරීරික සෞඛ්‍ය තත්වයෙන් වෙනස් වූ සහ හඳුනාගත හැකි සලකුණු සහ රෝග ලක්‍ෂණ මඟින් සනාථ කල හැකි ශාරීරික වෙනස් වීම්.

**"වෛද්‍යවරයා"**

වෛද්‍ය උපාධියක් සහිතව නීත්‍යානුකූලව සුදුසුකම්ලත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෛද්‍ය කවුන්සලයේ හෝ ඔහු හෝ ඇය සේවය කරන රටෙහි වෛද්‍ය අධිකාරියෙහි ලියාපදිංචි වී ඇති හෝ නීත්‍යානුකූල බලපත්‍රයක් ඇතිව, අවසර ලද ක්‍ෂේත්‍රය තුල ක්‍රියාකරන්නාවූද තැනැත්තා වේ.

**"රෝහල"** යනුවෙන් අදහස් වනුයේ

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාපිත නීති රීති වලට හෝ ඊට සමාන ප්‍රමිතීන්ට (සමානත්වය තීරණය කරනු ලබන්නේ සමාගම විසිනි) අනුකූලව පිහිටුවන ලද බලපත්‍රලාභී ආයතනයක් වීම.

(ii) නීත්‍යානුකූල සුදුසුකම් (එම්.බී.බී.එස් හෝ එම්.ඩී. බටහිර වෛද්‍ය උපාධිය ඇති) ලද වෛද්‍යවරුන් එක් අයකුට වැඩි ගණනක් සෑම විටම සේවයේ නිරතව ඇති ආයතනයක් වීම.

(iii) මූලික වශයෙන් නේවාසික රෝගීන් සඳහා රෝග නිශ්චය කිරීමේ හා ප්‍රතිකාර කිරීමේ සේවාවන් ලබා දිය හැකි වූද, නීත්‍යානුකූල සුදුසකම්ලත් වෛද්‍යවරයකු විසින් හෝ එවන් වෛද්‍යවරයෙකුගේ නිරන්තර අධීක්‍ෂණය යටතේ ශල්‍යකර්ම කිරීමේ හැකියාව ඇති සහ වෛද්‍යවරයෙකුගේ අධීක්‍ෂණය යටතේ ක්‍රියාත්මක, ලියාපදිංචි, අදාළ සුදුසුකම් ලත් හෙද සේවයක් ලබාගත හැකි ආයතනයක් වීම.

(iv) දැඩි සත්කාර ඒකකයක් ඇති ආයතනයක් වීම.

(v) නේවාසික රෝගීන්ගේ වෛද්‍ය සටහන් දෛනිකව පවත්වාගෙන යන්නා වූ හා එම සටහන් සඳහා සමාගමේ බලයලත් නිළධාරියාට ප්‍රවේශය ඇත්තා වූ ආයතනයක් වීම.

(vi) නේවාසික රෝගීන් සඳහා වෛද්‍ය පහසුකම් ඇත්තා වූ සහ සාමාන්‍යයෙන් පිළිගත් විද්‍යාත්මක ක්‍රම භාවිතා කරන ආයතනයක් වීම.

(vii) පහත දැක්වෙන ආයතන නිර්වචනයෙන් බැහැර වන අතර ඒවා “රෝහල්” ලෙස සලකනු නොලැබේ.

  (a) ආයුර්වේද රෝහල් හෝ දේශීය, හෝමියෝපති හෝ කටු චිකිත්සක ප්‍රතිකාර සැපයීම සඳහා පමණක් ඇති ස්ථාන.

  (b) විවේක, චිකිත්සක ස්ථාන පූර්ණ සුවය ලැබෙන තෙක් රඳවා තබාගන්නා ස්ථාන, භාරකාර ස්ථාන හා ස්වස්තාල.

  (c) තමාගේ කටයුතු කර ගැනීමට නොහැකි අය රඳවා තබාගන්නා ස්ථාන, වැඩිහිටියන්, මද්‍යසාර හා මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් මානසික අසාමාන්‍යතාවයන්ගෙන් පෙළෙන අය අබලතාවයට ලක්වූවන් හා රැක බලාගැනීම අවශ්‍ය කරන්නා වූ පුද්ගලයන් රදවා තබාගන්නා ස්ථාන.

**"අසනීපය"**

සාමාන්‍ය ශාරීරික සෞඛ්‍ය තත්වයෙන් වෙනස් වූ සහ හඳුනාගත හැකි සලකුණු සහ රෝග ලක්‍ෂණ මඟින් සනාථ කල හැකි ශාරීරික වෙනස් වීම්.

**"තුවාලය"**

අනෙකුත් සියලුම හේතුවලින් බැහැරව අහඹුවක් මඟින් සිදුවන ශාරීරික හානිය.

**"එකවර ගෙවන මුදල"**

ඔප්පුව යටතේ ආවරණය වන ප්‍රතිලාභයක් වෙනුවෙන් එකවර ගෙවනු ලබන මුදල.

Specimen

**"අතිරේක ආවරණ"**

ප්‍රධාන ඔප්පුවට අමතරව ලබාගත හැකි ආවරණ. මේ සඳහා අමතරව වාරික ගෙවිය යුතුය.

**"ශල්‍ය වෛද්‍යවරයා"**

එම්.එස්./එෆ්.ආර්.සී.එස් (ශල්‍ය ශාස්ත්‍රය) හෝ එම්.එස් (නාරි හා ප්‍රසව) හෝ එම්.ආර්.සී.ඕ.ජී/එෆ්.ආර්.සී.ඕ.ජී.යන වෛද්‍ය උපාධීන් මඟින් සුදුසුකම් ලැබූ හා ඔහු හෝ ඇය සේවය කරන්නා වූ රටෙහි වෛද්‍ය අධිකාරියෙහි නියමාකාරයෙන් ලියාපදිංචි වී බලපත්‍ර ලබාගත් තැනැත්තෙකු වේ.

**"ඔප්පු සංවත්සරය"**

ඔප්පුවේ ආරම්භක දිනයෙන් මාස දොළහකට පසු එළඹෙන දිනයයි.

**"ශල්‍යකර්ම / ශල්‍යකර්ම ක්‍රියා පටිපාටිය"**

විෂබීජ නාශක රඟහලක සුදුසුකම් ලත් ශල්‍ය වෛද්‍යවරයෙකු විසින් ශරීර පටක මත භෞතික හෝ උපකරණ මැදිහත්වීමක් අදහස් කෙරේ

සාමාන්‍ය ශල්‍ය උපකරණ භාවිතා කරමින් දේශීය, කොඳු ඇට පෙළ හෝ සාමාන්‍ය නිර්වින්දනය යටතේ පරිසරයෘ

(අ) ඕනෑම අවයවයක් හෝ ශරීර කොටසක් කැපීම, ඉවත් කිරීම, විද්‍යුත් කැටි ගැසීම, අලුත්වැඩියා කිරීම, සංශෝධනය කිරීම හෝ ප්‍රතිනිර්මාණය කිරීම; හෝ

(ආ) හැසිරවීමෙන් අස්ථි බිඳීමක් හෝ විස්ථාපනයක් අඩු කිරීම; හෝ

(ඇ) ස්වරාලය, බ්‍රොන්කස්, ශ්වාසනාලය, ිදවයිටම්, ආමාශය, අන්ත්‍රය, මුත්‍රාශය හෝ මුත්‍රා මාර්ගයෙන් ගල් සහ විදේශීය ද්‍රව්‍ය ඉවත් කිරීම.

**"ශල්‍ය කර්ම ලැයිස්තුව"**

මෙම ඔප්පුව යටතේ ආවරණය වන ශල්‍යකර්ම ලැයිස්තුව.

**"පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාව"**

හදිසි අනතුරක් හෝ රෝගයක් හේතුවෙන් පුද්ගලයකු පූර්ණ ලෙස සදාකාලිකවම අබලතා තත්ත්වයට පත්වීම; පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාවක් ලෙස සැලකෙන්නේ;

(i) අබලතාව සිදුවන අවස්ථාවේ සහ ඉන් පසුව කවරදාක හෝ කිසියම් ගාස්තුවක්, වැටුපක් හෝ ලාභයක් ඉපැයීමට හෝ ලබාගැනීමට හැකි, කිසිදු කාර්යයක, රැකියාවක හෝ වෘත්තියක නිරතවීමට හෝ සහභාගී වීමට නොහැකි වීම. හෝ

(ii) ඒ හේතුවෙන් සිදුවන

   (a) ප්‍රකෘතිමත් කළ නොහැකි ලෙස සම්පූර්ණයෙන් ඇස් දෙකම අන්ධ වීම හෝ

   (b) ප්‍රකෘතිමත් කළ නොහැකි ලෙස හා පූර්ණ ලෙස මැණික්කටුව හෝ වලලුකර හෝ ඊට ඉහළින් ගාත්‍රා දෙකක් අකර්මණ්‍යතා තත්ත්වයට පත්වීම හෝ

   (c) පූර්ණ ලෙස හා නැවත ප්‍රකෘත්තිමත් කළ නොහැකි ආකාරයෙන් එක් ඇසක පෙනීම නැති වීම සහ මැණික්කටුව හෝ වලලුකර හෝ ඊට ඉහළින් එක් ගාත්‍රාවක් සම්පූර්ණයෙන් නැවත ප්‍රකෘත්තිමත් කළ නොහැකි ආකාරයෙන් අකර්මණ්‍ය වීම.

Specimen